## විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම 2025.06.03
## පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)

2025 වර්ෂයේ II කාර්තු වෙනි II වන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම 2025.06.03 දින නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) කාර්යාලයේ දී පැවැත් වූ අතර එහි රැස්වීම් වාර්තාව පහත පරිදි ඉදිරිපත් කරමි.

2025.06.03 වන දින පෙ.ව.9.30 ට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) ආර්.පී.ගුණවර්ධන මියගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ අතර එදින එතුමිය විසින් පැමිණ සිටි සියළු නිලධාරීන් පිළිගෙන ප්‍රාදේශීය ඉංජිනේරුවරු මෙම රැස්වීම සඳහා Zoom තාක්‍ෂණය ඔස්සේ සම්බන්ධ කරගෙන රැස්වීමේ කටයුතු ආරම්භ කෙරුණි.

**<u>සහභාගී වූ නිලධාරීන්</u>**

01. ආර්.පී.ගුණවර්ධන මිය - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) - පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)
02. ටී.කේ.ආර්.දිලේශිකා මිය - ප්‍රධාන ගණකාධිකාරී - පළාත් ඉංජිනේරු කර්යාංශය (බ.ප.)
03. එම්.කේ.සුගත් ද සිල්වා මයා - විගණන අධිකාරී - ජාතික විගණන කාර්යාලය.
04. එන්.එච්.සුමින්ද මයා - අධ්‍යක්‍ෂ (ගිණුම් හා ගෙවීම්) - ප්‍රධාන ලේකම් කාර්යාලය (බ.ප.)
05. ඕ.සී.නිලුෂිනි මිය - අධ්‍යක්‍ෂ (අභ්‍යන්තර විගණක) - අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව (බ.ප.)
06. පී.එල්.ඩී.ඒ.එස්.පනාගොඩ මිය - අධ්‍යක්ෂ ඉංජිනේරු - පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)
07. එස්.එච්.චන්දන මයා - අධ්‍යක්‍ෂ (ගොඩනැගිලි) - පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)
08. පී.ඩී.ආර්.නදීරා මිය - ප්‍රධාන ඉංජිනේරු (නිර්මාණ) - පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)
09. ඩී.ජී.මානවඩු මයා - මුලස්ථාන ඉංජිනේරු - පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)
10. එල්.එම්.ඩී.ආර්.ද මෙල් මිය - ගණකාධිකාරී - පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)
11. කේ.කේ.පී.රණතුංග මිය - පරිපාලන නිලධාරී - පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)
12. ඩබ්.අයි.නිලාන්ති මෙය - මුදල් සහකාර - පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)
13. ඩබ්.නයෝමි සී. කුරේ මිය - කළමනාකරණ සේවා නිලධාරී - පළාත් ඉංජිනේරු කාර්යාංශය(බ.ප.)
14. කේ.එල්.එම්.සඳරුවණි - කළමනාකරණ සේවා නිලධාරී - පළාත් ඉංජිනේරු කාර්යාංශය(බ.ප.)
15. එඅ.එල්.එම්.පෙරේරා මිය - කළමනාකරණ සේවා නිලධාරී - පළාත් ඉංජිනේරු කාර්යාංශය(බ.ප.)
16. ඩබ්.කේ.ඒ.නාලනි මිය - සංවර්ධන නිලධාරී - පළාත් ඉංජිනේරු කාර්යාංශය(බ.ප.)

**ප්‍රාදේශීය ඉංජිනේරුවරු මෙම රැස්වීම සඳහා Zoom තාක්‍ෂණය ඔස්සේ සම්බන්ධ වන ලදි.**

17. ජී.ඩී.විපුලසේන මිය - ප්‍රාදේශීය ඉංජිනේරු - බත්තරමුල්ල.
18. ආර්.ඩබ්.සී.ගුණවර්ධන මිය - ප්‍රාදේශීය ඉංජිනේරු - කොළඹ.
19. ඒ.කේ.රුවන් අලවත්ත මයා - ප්‍රාදේශීය ඉංජිනේරු - මීගමුව.
20. එල්.බී.සම්පත් පෙරේරා මයා - ප්‍රාදේශීය ඉංජිනේරු - හොරණ.
21. එස්.ඩී.සේනාරත්න මිය - ප්‍රාදේශීය ඉංජිනේරු - පානදුර.
22. පී.ආර්.මධුරංග මයා - ප්‍රාදේශීය ඉංජිනේරු - මීනුවන්ගොඩ.
23. ඉනෝකා කොටඹගේ මිය - ප්‍රාදේශීය ඉංජිනේරු - බියගම.
24. එල්.ඩී.ගලබඩ මිය - ප්‍රාදේශීය ඉංජිනේරු - ගම්පහ.
25. එල්.බී.සම්පත් පෙරේරා මයා(රා.ආ) - ප්‍රාදේශීය ඉංජිනේරු - හෝමාගම.
26. ඩබ්.ජී.ආර්.වේලාතන්ත්‍රි මයා - ප්‍රාදේශීය ඉංජිනේරු - මතුගම.
27. පී.ආර්.මධුරංග මයා - ප්‍රාදේශීය ඉංජිනේරු - වත්තල.
28. ඩී.සී.එන්.කලන්සූරිය මයා - ප්‍රාදේශීය ඉංජිනේරු - කළුතර.
29. එස්.ඩී.සේනාරත්න මිය - ප්‍රාදේශීය ඉංජිනේරු - රත්මලාන.

## 01. පසුගිය විගණන කමිටු වාර්තාවේ ප්‍රගතිය සාකච්ඡා කිරීම

<table>
<tr><th></th><th>කාරණය</th><th>සාකච්ඡා වූ කරුණු/ තීරණ</th><th>වගකීම</th></tr>
<tr><td>01</td><td>මාසික බැංකු සැසඳුම්</td><td>බැංකු සැසඳුම් මෘදු පිටපත ඇතම් ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය විසින් නියමිත දින වන විට අභ්‍යන්තර විගණන කාර්යාලය වෙත එවා නොමැති බව අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන) ප්‍රකාශ කරන ලදී.<br><br>මාසික බැංකු සැසඳුමේ මෘදු පිටපත පමණක් ඊලග මස 15 දිනට පෙර අභ්‍යන්තර විගණක වෙත ඉදිරිපත් කිරිමට කටයුතු කරන ලෙස නැවතත් නි.ප්‍ර.ලේ. (ඉංජිනේරු) විසින් ප්‍රාදේශීය ඉංජිනේරුවරුන්ට දැනුවත් කරන ලදී.<br><br>(බැංකු සැසඳුම් මාසිකව සකස් කළද ඊළඟ මස 15 දිනට පෙර නොලැබෙන බව් නිරීක්ෂණය වූ බැවින් )</td><td>ප්‍රධාන ගණකාධිකාරි / ගණකාධිකාරි සියළුම ප්‍රාදේශීය ඉංජිනේරුවරු</td></tr>
<tr><td>02</td><td>අත්තිකාරම් ‘බී’ ගිණුමට අදාලව ණය අය නොවීම.</td><td>

**2025.05.31 දිනට නොපියවා ඇති ණය පිළිබඳ වාර්තාව**

<table>
<tr><th>අනු අංකය</th><th>නිලධාරිගේ නම</th><th>තනතුර</th><th>ස්ථාන මාරුවී ගිය දිනය</th><th>2025.05.31 දිනට අයවීමට ඇති ණය ශේෂය රු.</th></tr>
<tr><td></td><td colspan="4">පළාත් පාලන ආයතන වලට ස්ථාන මාරුවී ගිය නිලධාරින්ගෙන් අයවිය යුතු ණය ශේෂයන්</td></tr>
<tr><td>1</td><td>ඩබ්.ඒ.ටී.එස්. වනිගසුන්දර මිය</td><td>කළමනාකරණ සහකාර</td><td>2020.01.01</td><td>රු. 110,615.00</td></tr>
<tr><td></td><td></td><td colspan="3">මාසික වාරික වශයෙන් නිරවුල් වන දේපළ ණය ශේෂයක් වන අතර සම්පූර්ණ ණය ශේෂය පියවීමට මෙතෙක් කටයුතු කර නොමැත.</td></tr>
<tr><td>3</td><td>පී.ජී.එල්.ආලෝකා මිය</td><td>තාක්ෂණ නිළධාරි</td><td>2020.02.10</td><td>රු. 94,404.00</td></tr>
<tr><td></td><td></td><td colspan="3">රු.2,486.00 මාසික වාරික වශයෙන් අය වූ ණය ශේෂයක් වන අතර 2025 ජනවාරි මස සිට ණය වාරික අය කර මෙම කාර්යාලය වෙත ප්‍රේෂණය නොවීය. එබැවින් ඊට අදාල හේතු පැහැදිලි කරන ලෙස සහ සම්පූර්ණ ණය ශේෂය පියවීමට කටයුතු කරන ලෙස මගේ අංක CSWP/ENG-ACC/8-'/FI/8-2025 හා 2025.04.02 හා 2025.05.16 නැති ලිපි මඟින් මොරටුව මහා නගර සභාවේ නාගරික කොමසාරිස් දැනුවත් කර ඇත.</td></tr>
<tr><td>4</td><td>ආර්.පී.එස්.විදුරංග මයා.</td><td>කළමනාකරණ සේවා නිලධාරි</td><td>2023.07.17</td><td>රු. 214,961.00</td></tr>
<tr><td></td><td></td><td colspan="3">කොළඹ මහා නගර සභාව වෙත ස්ථාන මාරු වීමෙන් අනතුරුව සේවය හැරගොස් ඇති නිලධාරියෙකි. කොළඹ මහා නගර සභාව මඟින් ණය ශේෂ නොපියවීම හේතුවෙන් එම ණය ශේෂය පියවීමට කටයුතු කරන ලෙස මගේ අංක CSWP/ENG-ACC/8-10/FI/1 හා 2025.02.17 දිනැති ලිපිය හා CSWP/ENG-ACC/8-1/FI/8-2025 අංක දරන 2025.03.26 හා 2025.05.16 දිනැති ලිපි මඟින් පළාත් පාලන කොමසාරිස් වෙත දැනුම් දී ඇත.</td></tr>
<tr><td></td><td colspan="3"></td><td>**419,980.00**</td></tr>
<tr><td></td><td colspan="4">රජයට /වෙනත් පළාත් සභාවකට /පළාත් සභාවේ වෙනත් කාර්යාලයකට ස්ථාන මාරුවී ගිය නිලධාරින්ගෙන් අයවිය යුතු ණය ශේෂ - විදේශ ධූක සේවය සඳහා</td></tr>
</table>

</td><td>ප්‍රධාන ගණකාධිකාරි / ගණකාධිකාරි</td></tr>
</table>

<table>
<tr><td></td><td></td><td>
<table>
<tr><td>6</td><td>එම්.එච්.ගුණසේකර මිය</td><td>කළමනාකරණ සේවා නිලධාරි</td><td>2020.02.07</td><td>රු.78,600.00</td></tr>
<tr><td></td><td></td><td colspan="3">විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත අනුයුක්තව (විදේශ දූත මණ්ඩල සේවයේ) රාජකාරි කල නිලධාරිනියක් බැවින් කාර්තු වශයෙන් පියවූ ණය ශේෂයකි. එම නිලධාරිනියගේ ණය වාරික මේ වන විට ප්‍රේෂණය නොවන අතර එම ණය ශේෂය පියවීමට කටයුතු කරන ලෙස ඇයගේ වර්තමාන නව සේවා ස්ථානය වන බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත මගේ අංක CSWP/ENG-ACC/8-1/FI/8-2025 හා 2025.05.19 දිනැති ලිපිය මඟින් දැනුම් දී ඇත.</td></tr>
<tr><td></td><td colspan="4">සේවය හැර ගොස් ඇති නිලධාරින්ගෙන් අයවිය යුතු ණය ශේෂ</td></tr>
<tr><td>7</td><td>ආර්.ජී.එම්.එම්. රණසිංහ මිය.</td><td>තාක්ෂණ නිලධාරි</td><td>2013.01.15</td><td>රු. 119,689.00</td></tr>
<tr><td></td><td></td><td colspan="3">මෙම නිලධාරිනියගේ ණය අය කර ගැනීම සම්බන්ධයෙන් පවතින නීති ක්‍රියාවලිය පිළිබඳ වත්මන් ප්‍රගතිය අංක:CSWP/ENG-ACC/8-1/17/FI/1 හා 2025.03.25 සහ 2025.05.16 දිනැති ලිපි මඟින් පරිපාලන නිලධාරි වෙතින් විමසා ඇත. පරිපාලන නිලධාරි විසින් අංක: CSWP/ENG-ADM26-/8/FI/1 හා 2025.05.29 දිනැති ලිපියෙන් ප්‍රධාන නීති නිලධාරිගෙන් විමසා ඇත.</td></tr>
</table>
නැවතත් පළාත් පාලන ආයතන වෙතින් මෙතෙක් නොපියවා ඇති ණය ශේෂ එකවර පියවන ලෙස පළාත් භාණ්ඩාගාරයට පිටපතක් සහිතව පළාත් පාලන කොමසාරිස් දැනුවත් කලද මෙතෙක් නොපියවා ඇති බැවින් එම ආයතන සඳහා දුරකථනයෙන් කතාකර ඉක්මනින් ණය ශේෂ පියවා ගැනිම සුදුසු බව අධ්‍යක්ෂ(අභ්‍යන්තර විගණක) හා අධ්‍යක්ෂ(ගිණුම් හා ගෙවීම්) පැහැදිලි කරන ලදි.</td><td></td></tr>
<tr><td>03</td><td>කල් ඉකුත්වූ තැන්පතු</td><td>2025.05.31 දිනට ප්‍රධාන කාර්යාලයේ හා අනෙකුත් ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලවල වසර දෙක ඉක්ම වු තැන්පතු නොමැත.</td><td>නි.ප්‍ර.ලේකම් (ඉංජිනේරු) ප්‍රධාන ගණකාධිකාරි / ගණකාධිකාරි / ප්‍රාදේශීය ඉංජිනේරු</td></tr>
<tr><td>04</td><td>මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය (නව සහ පැරණි පිහිටි භූමිය බස්නාහිර. පළාත් සභාවට පවරා ගැනීම</td><td>මේ වන විට මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය (නව සහ පැරණි) පිහිටි භූමියට අදාල පිඹුර සකස්කර අවසන් බවත් එහෙත් තව ලේඛන පරීක්ෂාවක් සිදු වෙමින් පවතින බව මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙන් විමසූවිට දැනගත් බවත්, මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙන් පිඹුර ලද විගස මෙම භූමිය පළාත් සභාවට පවරා දිමට කටයුතු කරන බව ප්‍රාදේශීය ලේකම් පැවසු බවත් මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරු පැහැදිලි කරන ලදි.<br><br>කඩිනමින් මෙම භූමිය පළාත් සභාවට පවරා ගැනිමට කටයුතු කරන ලෙස නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) විසින් මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරුට උපදෙස් දෙන ලදි.</td><td>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) / පරිපාලන නිලධාරි/ මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරු</td></tr>
<tr><td></td><td>මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරු</td><td>මෙම ගොඩනැගිල්ල කුලි පදනම මත වෙනත් පාර්ශවයකට ලබාදීමට ඇති හැකියාව පිළිබඳව සොයාබැලීම සඳහා මාසිකව අය කළහැකි කුලී මුදල කොපමණද යන්න සම්බන්ධයෙන්</td><td>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) /</td></tr>
</table>

| | | | |
|---|---|---|---|
| | කාර්යාලයේ ගොඩනැගිල්ල භූමිය වෙනත් ආයතනයකට ලබාදීම. | තක්සේරුවක් ලබා දෙන ලෙස මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරු විසින් අංක: CSO/ENG/5/13/MA01/31/2024 සහ 2025.03.05 සහ 2025.04.21 දිනැති ලිපි මගින් තක්සේරු දෙපාර්තමේන්තුවේ ගම්පහ ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රධාන තක්සේරුකරු වෙතින් විමසීමක් කර ඇත.<br>• මෙම ගොඩනැගිල්ලේ තක්සේරු වටිනාකම තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලබාගෙන වෙනත් ආයතනයකට ලබා දිම කරන ලෙස විගණන අධිකාරි පැහැදිලි කරන ලදි. | පරිපාලන නිලධාරි/ මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරු |
| | අවිස්සාවේල්ල ගොඩනැගිල්ල | ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන ප්‍රාදේශීය කළමනාකරුගේ අංක: ශ්‍රී ලංගම/සබර/ප්‍රපාක/01 සහ 2025.04.23 දිනැති ලිපිය මගින් මෙම ගොඩනැගිල්ලේ අයිතිය නීත්‍යානුකූලව තම සමාගම වෙත පවරා දෙන ලෙස ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත.<br><br>ලංකා ගමනාගමන මණ්ඩලයට පවරා දිම සම්බන්ධයෙන් ප්‍රධාන ලේකම්ගෙන් උපදෙස් විමසා ඇති අතර මේ සම්බන්ධයෙන් පළාත් ප්‍රධාන ලේකම් සමඟ සාකච්ඡාවක් 2025.06.11 දින පැවැත්වීමට නියමිතව ඇත | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) / පරිපාලන නිලධාරි/ හෝමාගම ප්‍රාදේශීය ඉංජිනේරු |
| | ඉංජිනේරු කාර්යාංශයට අයත් නිල නිවාස සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත පවරා දීම | නිල නිවාස සෞඛ්‍ය අමාත්‍යාංශයට පැවරීමට අදාල මැණුම් කටයුතු සම්බන්ධයෙන් සීතාවක ප්‍රාදේශීය ලේකම් විසින් මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද මැනුම් ඉල්ලීමෙහි පැවති අඩුපාඩු නිවැරදි කර නැවත මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බව සීතාවක ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා ඇති බවත්, ඒ අනුව ඉදිරි මාසය තුළ මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කිරීමට පියවර ගන්නා බවත්, හෝමාගම ප්‍රාදේශීය ඉංජිනේරුගේ අංක CSO/ENG/5/04/CMSO/විගණන/2025 සහ 2025.05.16 දිනැති ලිපිය මගින් දන්වා ඇත. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) / පරිපාලන නිලධාරි/ හෝමාගම ප්‍රාදේශීය ඉංජිනේරු |
| 05 | ලිපිගොනු කළමනාකරණ ක්‍රියාවලිය සම්බන්ධ මෘදුකාංග පද්ධතිය (DMS) | ඉංජිනේරු කාර්යාංශයේ ලිපිගොනු කළමනාකරණ ක්‍රියාවලින් ස්වයංක්‍රියකරණ මෘදුකාංග පද්ධතිය (DMS) භාවිතායෙන් රාජකාරි කටයුතු සිදු කිරීමේදි පැන නැගී ඇති ගැටළු තොරතුරු තාක්ෂණ සම්පත් අධිකාරිය (බ.ප.) වෙත දන්වා ඇති අතර, ඒ සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග පිළිබඳ සති 02 ක් තුළ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) වෙත වාර්තා කරන ලෙස නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)ගේ අංක: CSWP/ENG-ADM/55-1/FI/01(A) හා 2025.04.30 දිනැති ලිපිය මගින් තොරතුරු තාක්ෂණ සම්පත් අධිකාරිය වෙත දන්වා ඇත.<br><br>මේ සම්බන්ධයෙන් 2025.05.14 වන දින නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)ගේ මුලිකත්වයෙන් පවත්වන ලද සාකච්ඡාවේ දි ගනු ලැබූ තීරණ අනුව DMS මෘදුකාංග පද්ධතිය සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කිරීමට එකඟ වන ලද බව අධ්‍යක්ෂ ඉංජිනේරුගේ අංක: CSWP/ENG-CON/5-6/FI/1(A) හා 2025.05.20 දිනැති ලිපියෙන් වාර්තා කර ඇත.<br><br>මෘදුකාංග ලබා ගැනීමේදි රාජ්‍ය ආයතනයන් මගින් ලබා ගැනීම වඩාත් සුදුසු බවත් පෞද්ගලික සමාගම් සම්බන්ධව කටයුතු කිරීමේදි දෙවරක් සිතිය යුතු බවත් අධ්‍යක්ෂ (ගිණුම් හා ගෙවීම් ) පැහැදිලි කරන ලදි. | නි.ප්‍ර.ලේ. ඉංජිනේරු/ අධ්‍යක්ෂ ඉංජිනේරු / ගොඩනැගිලි අධ්‍යක්ෂ |

2 ) විගණන අධිකාරිගේ අදහස් හා පැහැදිලි කිරීම්

| | මතුකළ කරුණු |
|---|---|
| 1. | නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සම්බන්ධයෙන් හොඳින් අධ්‍යනයකර එහි සඳහන් කරුණු සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කරන ලෙසත්, |
| 2. | පානදුර ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයේ විගණනයට ගිය අවස්ථාවේදී 2024 වර්ෂ අවසානගේ ලියු මුදල් නොවූ චෙක්පත් තිබූ බව නිරීක්ෂණය වූ බවත්, චෙක්පත් නිකුත් කිරිමේදී එම චෙක්පත් අදාල පුද්ගලයාගෙන් භාරගත් බවට අත්සන කර නොතිබු බවත්, චෙක්පත් බාරගත් බවට බාරගත් අයගේ නම හැඳුනුම්පත් අංකය අත්සන හා චෙක්පත බාරගත් දිනය සඳහන් කර ලේඛනයක් පවත්වාගෙන යා යුතු බවත් පැහැදිලි කරන ලදී. |
| 3. | මිණුවන්ගොඩ යටියන මධ්‍ය මහා විද්‍යාලයේ වැසිකිලි අළුත්වැඩියා නිමකර නොතිබූ බවත්, ඒ සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කර කඩිනමින් අවසන් කරන ලෙස, |
| 4. | දිස්ත්‍රික් කෘෂි පුහුණු මධ්‍යස්ථානයේ කුකුළු කුඩුවල වැඩ නිමකර නොතිබූබව, |
| 5. | පානදුර සිසුවිරු විද්‍යාලයේ තෙමහල් ගොඩනැගිල්ල සැලැස්ම සම්බන්ධයෙන් ගැටළු සහගත තත්වයක් පැනනැගි තිබූ බව නිරීක්ෂණය වී ඇති බව, |

(3) අධ්‍යක්ෂ අභ්‍යන්තර විගණනකගේ අදහස් හා පැහැදිලි කිරම්

| | මතුකළ කරුණු |
|---|---|
| 1 | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම සම්බන්ධව අභ්‍යන්තර විගණනයෙන් නිකුත් කර ඇති මාර්ගෝපදේශ සංග්‍රහයක් ඇති බවත් එම මාර්ගෝපදේශ සංග්‍රහය සම්බන්ධයෙන් නව චක්‍ර ලේඛයක් නිකුත් කර ඇති බවත්, එම චක්‍ර ලේඛය ආදාල ආකෘති සමඟ සියළු ආයතන දැනුවත් කරන බවත්, ඒ අනුව ඉදිරි රැස්වීම් පැවැත්විමේදි එම මාර්ගෝපදේශ සංග්‍රහයේ ඇතුලත් ආකෘති ප්‍රකාරව සිදු කරන ලෙසත්, දැනුවත් කරන ලදි. |
| 2. | ප්‍රධාන ලේකම් කාර්යාලයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදි තම ආයතනයට අදාලව සාකච්ඡා කරනු ලබන කොටස් තම ආයතනනයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ සාකච්ඡා කරන ලෙසත් |
| 3. | බහුතරයක් ඉදිරිකිරිම් සඳහා සකස් කර ඇති ඇස්තමේන්තුගත කරුණු වලින් 50% ක්වත් ඇස්තමේන්තුගත කරුණු අනුව සිදුව නොමැති බව අභ්‍යන්තර විගණන අංශයේ නිලධාරින් ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාංශ අධීක්ෂණයට ගිය අවස්ථාවන්හිදි පොදුවේ හඳුනාගෙන ඇතිබව, ඇස්තමේන්තු සකස්කිරිමේදි වැඩි අවධානයක් යොමු කරන ලෙස, උදා- හොරණ ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයේ විගණන නිරික්ෂනය |
| 4. | ඉදිකිරිම් ගැන අවධානය යොමු කරන තරම් යම් යම් මිලදී ගැනිම් වලදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ගැන අවධානය යොමු නොවන බව නිරිකෂණය වූ බව උදා- මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයේ විගණන නිරීක්ෂනය.<br>ඉදිකිරිම් වලදී මෙන්ම භාණ්ඩ මිලදී ගැනිමේදී ද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ කෙරෙහි වැඩි අවධානය යොමු කර විනිවිධ භාවයෙන් යුතුව ප්‍රසම්පාදන කටයුතු සිදු කරන ලෙසත් |
| 5. | දිගින් දිගටම ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල කිහිපයක් ප්‍රධාන කරගෙන පෙත්සම් ලැබෙන බවත්, එම පෙත්සම්වල එම කාර්යාලවල සේවයේ නියුතු කාර්ය මණ්ඩලයේ විවිධ තනතුර වලට අදාලව ප්‍රසම්පාදන කටයුතුවලිදි ආදාල තොරතුරු බාහිර පර්ශවයන් වෙතට ලැබී ඇති බවට කරුණු ලැබී ඇති බැවින් ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලවල කාර්ය මණ්ඩලය ගැන මීට වඩා අධීක්ෂණයෙන් සිටිය යුතු බවත්, වසර 5ට වැඩි සේවා කාලයක් ඇති නිලධාරින්ට ස්ථාන මාරුවීම් ලබා දිමටත්, වසර 20 කට වඩා වැඩි සේවා කාලයක් ඇති සුළු සේවකයින් ද සිටින බැවින් මේ සම්බන්ධයෙන් ස්ථාන මාරු ලබාදිමට අදාල ප්‍රධාන ලේකම් කාර්යාලය දැනුවත් කරන ලෙසත් පැහැදිලි කිරිමක් සිදු කරන ලදි. |
| 6. | බැංකු සැසඳුම් අනිවාර්යයෙන්ම 15 ට පෙර විගණනයට ඉදිරිපත්කළ යුතු බව, |

<u>අධ්‍යක්ෂ - ගිණුම් හා ගෙවීම්ගේ අදහස් හා පැහැදිලි කිරීම්</u>

| | මතුකළ කරුණු |
|---|---|
| 1. | PSDG, CBG, GEMP, NSBS ව්‍යාපෘති යටතේ වූ ගෙවීම් ඉක්මන් කිරීම සඳහා මේ වන විට ප්‍රසම්පාදන කර අවසන් ඉදිකිරීම් සඳහා අත්තිකාරම් ගෙවීමට හා මේ වන විට ඉදිකිරීම් අවසන් වෙමින් පවතින බිල්පත් ඉදිරිපත් කිරීමට හැකියාවත් ඇති ගෙවීම් සඳහා අවශ්‍ය වෙතැයි හැඟෙන මුල්‍ය වටිනාකම් පුරෝකථනය කර මාස දෙකකට වරක් පළාත් භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කරන ලෙස පැහැදිලි කරන ලදි. |
| 2. | ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලවල චෙක්පත් අත්සන් කිරීමේදී ප්‍රාදේශීය ඉංජිනේරුවරු ඉතා පරිස්සම්කාරී විය යුතු බවත්, හිස් චෙක්පත් අත්සන් කිරීමෙන් වලකින ලෙසත් කාර්යාලවල බැංකු සැසඳුම් සකසන නිලධාරීන්ට ඒ සම්බන්ධයෙන් හොඳ අවබෝධයක් තිබේද යන්නත් ,චෙක්පත් භාරදීමේ ලේඛනයක් පවත්වාගෙන යාම වැනි අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් පවත්වාගෙන යාම ආරක්ෂාකාරී බවත්, |
| 3. | මධ්‍යම රජයෙන් ප්‍රතිපාදන ලබාගෙන කරනු ලබන ඉදිකිරීම් වලිදි භාණ්ඩාගාරය හරහා ප්‍රතිපාදන ලබාගෙන භාණ්ඩාගාරය හා ප්‍රධාන කාර්යාලය දැනුවත්කර ඉදිකිරීම් අරම්භකරන ලෙසත් වර්ෂ අවසන් වීමට ආසන්නව මධ්‍යම රජයෙන් පළාත් සභාවට ලබාදෙන ඉදිකිරීම් සම්බන්ධයෙන් විශේෂයෙන් අවධානය යොමු කරන ලෙසටත් ප්‍රාදේශීය ඉංජිනේරුවරුන්ව දැනුවත් කරන ලදි. |
| 4. | කිසිවිටක රජයට වාසිවන සේ සිතා නිති කඩ නොකරන ලෙසත් දැනුවත් කරන ලදි. |

2025 වර්ෂයේ දෙවන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම බවත්, ඔබගේ වටිනා කාලය වැයකර මෙම රැස්වීම සඳහා සහභාගි වීම සම්බන්ධයෙන් රජයේ විගණන අධිකාරි, අධ්‍යක්ෂ - අභ්‍යන්තර විගණක, භාණ්ඩාගාර නියෝජිත - අධ්‍යක්ෂ(ගිණුම් හා ගෙවීම්) , Zoom තාක්ෂණය ඔස්සේ සම්බන්ධ වූ සියළුම ප්‍රාදේශීය ඉංජිනේරුවරුන්ට හා අනෙකුත් සහභාගි වූ සියළු නිලධාරීන්ට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) ස්තුතියපල කිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු පෙ.ව.11.45 ට පමණ අවසන් කරන ලදි.


ඉංජි. ආර්.පී.ගුණවර්ධන
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු),
පළාත් ඉංජිනේරු කාර්යාංශය,
බස්නාහිර පළාත.

ඉංජි. ආර්. පී. ගුණවර්ධන
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)
ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)
5 වන මහල,
204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
ත්තරමුල්ල.

දුරකථන අංකය : 0112092524
ෆැක්ස් අංකය : 0112092523
විද්‍යුත් ලිපිනය : eng.org.acc@gmail.com